

# ජයග්‍රාහී නඩු තීන්දු 5 ක්

ප්‍රකාශණය

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

ජයග්‍රාහී නඩු තීන්දු 5 ක්

රචනය

ලක්ෂාන් ප්‍රනාන්දු

සංස්කරණය

පිලිප් දිසානායක

සෝදුපත්

පුබුදු රන්දිම

ප්‍රකාශණය

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය, අංක 555, කොළඹ පාර, කටුනායක.
දුරකථන - 011 7414800, 031 2231969, 031 2221604 ෆැක්ස් - 031 2231969,
විද්‍යුත් තැපැල - right2lifelk@gmail.com,
වෙබ් අඩවිය - www.right2lifelanka.org, www.aithiya.com

අනුග්‍රහය

එක්සත් ජාතීන්ගේ වධහිංසාවට එරෙහි අරමුදල - United Nation Volintry fund for Victims of Torture (UNVFVT)

අක්ෂර සංයෝජනය

රංජනී ගමගේ

පිටු සැකැස්ම හා කවර නිර්මාණය, මුද්‍රණය

ඩිසයින් සිස්ටම්, මාළිගාකන්ද පාර, කොළඹ 10

පටුන


| | | |
|---|---|---|
| 01. | ගුරුවරයෙකුගේ දත් ගැලවූ හක්මණ පොලිස් ස්ථානාධිපති | 05 |
| 02. | තරුණයෙකුගේ ඇසක් අහිමි කළ පිටබැද්දර පොලීසිය | 08 |
| 03. | නම් පැටලැවිල්ලක් නිසා ජීවිතයක් බිලිගත් වත්තල පොලීසිය | 11 |
| 04. | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ස්ත්‍රී දූෂණය | 15 |
| 05. | බදුල්ල හැඩ වූ කන්දකැටියේ සඳුන් මාලිංග ඝාතනය | 17 |


හැඳින්වීම

රටේ නීතියේ ආධිපත්‍ය බිඳ වැටෙමින් තිබුණු දුෂ්කර වකවානුවක සිවිල් සමාජ ක්‍රියාකාරිකයන් කිහිපදෙනකුගේ මැදිහත්වීමෙන් පැන නැගුණු රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය මානව හිමිකම් ඇතුලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කිරීම වෙනුවෙන් හා විශේෂයෙන් පොලිස් වධහිංසාව හා නීති විරෝධී ඝාතනයන්ට එරෙහිව ඍජුවම කටයුතු කරනු ලබන සමාජ සංවිධානයකි.

2002 වසරේ දී ඇරඹි රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය බහු වාර්ගික, බහු ආගමික මෙන්ම, බහු සංස්කෘතික සමාජයක් තුළ එකිනෙකාට ගරු කරන සර්ව සාධාරණත්වය, සමානාත්මතාවය පිළිගනිමින් ජීවිතයට ඇති අයිතිය අගයන පුරවැසි සමාජයක් ගොඩනැගීම තම අරමුණ කර ගෙන සිටී.

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය, මානව හිමිකම් ප්‍රවර්ධන වැඩසටහන්, අධ්‍යාපනික වැඩසටහන් හා මානව හිමිකම් කඩුවූ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම හා විශේෂයෙන් මූලික අයිතිවාසිකම් කඩ වූ පුද්ගලයන් වෙනුවෙන් නීති ආධාර ලබා දීම, වින්දිතයින්ගේ ආරක්ෂාව, එම සිද්ධිය සම්බන්ධව ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සංවිධානයන් හි අවධානය යොමු කරවීම හා ඒ සම්බන්ධව පුළුල් ප්‍රචාරයක් ලබා දීම හරහා සමාජ අවධානය ඒ සඳහා යොමු කිරීම ආදී වශයෙන් මානව හිමිකම් ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් දැනට අවුරුදු 15 ක් තිස්සේ ක්‍රියාත්මක වෙයි.

පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරකීම සඳහා රජය විසින් යම් යම් නීති ප්‍රතිපාදයන් ඇති කර ඇතත්, සමහර රජයේ නිලධාරීන් තමන් වෙත නීතියෙන් ලබා දී ඇති ප්‍රතිපාදනයන්ට පටහැනිව ජනතාවගේ මූලික අයිතිවාසිකම් පවා කඩවන අයුරින් කටයුතු කිරීම සිදු කරනු ලැබීම ලංකාව තුළ ඉතා සුලභ සිදුවීමකි. එවැනි අවස්ථා වලදී අගතියට පත් පාර්ශවයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කිරීමට අප මැදිහත් වන අතර, පසුගිය අවුරුදු 15 ක කාලය තුළ එසේ අගතියට පත් වූ වින්දිතයින් දහස් ගණනාවක් වෙත අප විවිධාකාරයෙන් සහයෝගය ලබා දෙනු ලැබීය.

නමුත්, පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාවේ අපරාධ පරීක්ෂණ ක්‍රියාවලියේ බිඳවැටීමත්, අධිකරණ පද්ධතියේ බරපතල කඩා වැටීමත් හේතුවෙන් යුක්තිය පතා අධිකරණ ක්‍රියාමාර්ග වෙත යොමු වූ වින්දිතයින් බොහෝ පිරිසකට යුක්තිය ලැබීම වෙනුවට යුක්තිය ඉල්ලීමේ වරදට තව තවත් අතුරු පීඩාවන්ට පත්වීමට පවා සිදු විය. පසුගිය කාලය තුළ එසේ තමන්ට සිදු වූ අසාධාරණයන්ට එරෙහිව, විශේෂයෙන් පොලිස් වධහිංසාවන්ට එරෙහිව යුක්තිය ඉල්ලා සිටි වින්දිතයින් දෙපළක් වූ වත්තල පදිංචිව සිටි ජෙරාඩ් මර්වින් පෙරේරා හා මීගමුවේ පදිංචිව සිටි සුගත් නිශාන්ත මහතා ඉතා කෲර ලෙස මහ මගදී ඝාතනය කරනු ලැබීය.

යුක්තිය ඉල්ලා සිටි වින්දිතයින් ඝාතනය කිරීමත්, ලංකාවේ අධිකරණ ක්‍රියාවලියේ ඇති නඩු ප්‍රමාදය, අධික මුදල් කන්දරාවක් හා විශාල කාලයක් වැය කිරීමට සිදුවීම, රස්තියාදුව, අපරාධ පරීක්ෂණයන්හි ඇති විවිධාකාරයේ දෝෂ හා විශේෂයෙන් වින්දිතයින්ගේ ආරක්ෂාව වැනි විවිධාකරයේ ගැටළු නිසා පවරනු ලැබූ නඩු පවා වින්දිතයින් විසින්ම පසු කලෙක ඉල්ලා අස්කරගනු ලැබීය. එසේ නොමැති නම් අතරමග නතර කරනු ද ලැබීය.

1994 අංක 22 දරණ වධහිංසා වැළැක්වීමේ පනත යටතේ නීතිපතිවරයා විසින් අධිචෝදනා ගොනුකරනු ලැබූ, අප විසින් නීති ආධාර සැපයූ, ජාඇල රසික සම්පත්, මෝදර එරික් ඇන්ටෝනියා ක්‍රාමර්, මීගමුව චන්න ප්‍රසංක ප්‍රනාන්දු මහතාගේ නඩු දෙකක් ඇතුළු නඩු 04 ක් ඉහත තත්ත්වය නිසා ඔවුන් අධිකරණයට ලබා දුන් දිවුරුම් ප්‍රකාශ හේතුවෙන් එසේ ඉල්ලා අස්කරගනු ලැබූ නඩු අතරින් කිහිපයකි.

නමුත්, මෙම සියළු බාධක හා දුෂ්කරතා මැද පසුගිය වසරේ දී අප මූලිකත්වය ගෙන පවත්වාගෙන යනු ලැබූ නඩු අතුරින් ප්‍රධාන නඩු 05 ක අධිකරණ ජයග්‍රහණයන් ලබා ගැනීමට හැකි වීම වින්දිතයින්ට මෙන්ම අපටත්, පොදුවේ මානව හිමිකම් පිළිබඳව උන්දුව දක්වන සැමගේත් ජයග්‍රහණයකි.

2004 වසරේ දී වත්තල, මාකේවිට පදිංචිව සිටි තිදරු පියෙකු වූ ජෙරාඩ් මර්වින් පෙරේරා මහතා ඝාතනය කිරීම සම්බන්ධව මීගමුව මහාධිකරණයේ පැවැති මිනීමැරුම් නඩුව, 2009 වසරේ දී මාතර, හක්මණ පදිංචි විදුහල්පතිවරයෙකුව සිටි කේ. ඒ. හේමසිරි මහතාට පහරදීම සම්බන්ධව මාතර මහාධිකරණයේ පැවැති නඩුව, 2008 වසරේ දී ගාල්ල, පෝද්දල පදිංචිව සිටි අසන්ත අරවින්ද මහතාට පහරදීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් නඩුව, 2014 වසරේ දී බදුල්ල කන්දෙකැටිය ප්‍රදේශයේ පදිංචිව සිටි 18 හැවිරිදි තරුණයෙකුට පහරදී ඝාතනය කිරීම සම්බන්ධව බදුල්ල මහාධිකරණයේ පැවැති නඩුව හා 2005 වසරේ දී කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ දී ගුවන්තොටුපළ ආරක්ෂක අංශයේ නිලධාරීන් කිහිපදෙනෙකු විසින් ගෘහ සේවය සඳහා විදේශගත වීමට පැමිණි එක්දරු මවක් බලහත්කාරයෙන් ගුවන්තොටුපළ තුළදී දූෂණයට ලක්කිරීම සම්බන්ධව මීගමුව මහාධිකරණයේ පැවැති නඩුව, එම ජයග්‍රාහී නඩු වේ.

එම ජයග්‍රාහී නඩු සම්බන්ධව යම් අවබෝධයක් ලබා ගැනීම සඳහා මෙම ප්‍රකාශනය ඔබ අතට පත්කරනු ලබන අතර, අත්නොහැර එක් අරමුණක් මත ක්‍රියාකිරීම තුළින් ප්‍රමාද වී හෝ ජයග්‍රහණයක් ලබා ගැනීමට හැකි බව මෙම නඩු ජයග්‍රහණ සමාජයට කියාපානු ලබයි.

## 01. ගුරුවරයෙකුගේ දත් ගැලවූ හක්මණ පොලිස් ස්ථානාධිපති

හක්මණ, මහගෙදර වත්තෙහි පදිංචි කංකානම් ආරච්චිගේ හේමසිරි මහතා වයස අවුරුදු 61 ක සිංහල, බෞද්ධ, විවාහක විශ්‍රාමික ගුරුවරයෙකි. ගුරු සේවයෙන් විශ්‍රාම ගිය පසු තම ජීවිතයේ ඉතිරි කාල පරිච්ඡේදය මහජන යහපත පිණිස කැප කළ යුතු යැයි සිතූ හෙතෙම ඒ සඳහා දේශපාලන පක්ෂයකට සේවය කිරීම තුළින් තම දායකත්වය දේශපාලනය ඔස්සේ මහජනතාව වෙත ලබා දීමට තීරණය කළේය. ඒ අනුව, 2009 වර්ෂයේදී එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වී එහි හක්මණ කොට්ඨාසයේ කළමනාකරු ලෙස කටයුතු කළේය.

2009.12.19 වන දින පස්වරු 9.30 ට පමණ හේමසිරි මහතා ඇතුළු දස දෙනෙකුගෙන් සමන්විත එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයන් පිරිසක් මහජන රැස්වීමක් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට පක්ෂයෙන් එවා තිබූ පෝස්ටර් තම කොට්ඨාසයේ ඇලවීම සඳහා පිටත්ව ගියහ. පස්වරු 10.30 වනවිට ඔවුන් හක්මණ, වලස්මුල්ල පාරේ සිංගර් වෙළඳසැළ ඉදිරිපිටට පැමිණියේ තම පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ඇතුළු පාක්ෂික පිරිසක් එහි පැමිණෙන බව දන්වා තිබූ හෙයිනි. ඒ අවස්ථාවේදී පොලිස් ජීප් රථයක් ඉතා වේගයෙන් ඇදී ඇවිත් ඔවුන් අසළ නතර කරන ලදි. එම ජීප් රථය තුළ හක්මණ පොලීසියේ ස්ථානාධිපති කමල් අමරසිංහ සහ පොලිස් කොස්තාපල්වරයෙකු වන R.M.W.K. රත්නායක නැමැති අය සිටින බව හඳුනාගැනීමට හැකි විය.

ස්ථානාධිපතිවරයා හේමසිරි ඇතුළු පිරිසෙන්, "මොනවද පෝස්ටර්?", යනුවෙන් අසන ලදි. ඊට පිළිතුරු ලෙස එම පිරිස දෙසැම්බර් 20 වනදා පැවැත්වෙන විපක්ෂයේ පොදු සන්ධානයේ රැස්වීමේ පෝස්ටර්, යනුවෙන් පැවසීය. එවිට වියරු වැටුන ස්ථානාධිපතිවරයා, පරුෂ වචනයෙන් බැණ වැදී, "තොපි දන්නේ නැද්ද 17 වෙනිදායින් පස්සේ පෝස්ටර් ගහන්න බැරි බව, නැගපියව් ජීප් එකට", යනුවෙන් කෑ ගැසීය. හේමසිරි ඇතුළු පිරිස එය ප්‍රතික්ෂේප කරමින් විරෝධය පළ කර සිටියහ. ඒ අවස්ථාවේදී ජීප් රථයෙන් බැස පැමිණි ස්ථානාධිපති කමල් අමරසිංහ මහතා පිරිස තුළ සිටි ජයතිස්ස පලඟසිංහ නැමැත්තාගේ මුහුණ ප්‍රදේශයට පහරවල් හය හතක් ගසා, ඔහුගේ හිස ජීප් රථයේ බඳේ හප්පමින් පහර දෙන ලදි. එවිට, ඊට විරෝධය ප්‍රකාශ කරමින් හේමසිරි මහතා තම හඬ අවදි කර සිටියේය. එහිදී හේමසිරි මහතා වෙත පැමිණි ස්ථානාධිපතිවරයා තම මිට මොළවා වැරෙන් පහරක් හේමසිරි මහතාගේ මුහුණට එල්ල කළේය. එම පහර වැදීමෙන් හේමසිරි මහතාගේ මුඛයෙන් ලේ වැගිරෙමින් ඔහු බිම ඇද වැටුනි. අනතුරුව ස්ථානාධිපතිවරයා ජයතිස්ස පලඟසිංහ යන අයව ජීප් රථය තුළට නංවාගෙන පිටත් විය.

තුවාල ලබා සිටි හේමසිරි මහතාව ඔහු සමඟ සිටි පිරිස විසින් ඇල්ලවල රෝහල වෙත ගෙන යන විට රාත්‍රී 11.30 පමණ වී තිබුණි. රෝහලේදී ඔහුව පරීක්ෂා කළ වෛද්‍යවරුන් ඔහුව මාතර මහ රෝහලට මාරු කර යවන ලදී. එහිදී ඔහු පරීක්ෂා කළ වෛද්‍යවරු කියා සිටියේ ඔහුගේ මුඛයේ උඩු ඇන්ද පිපිරීමකට ලක් වී ඇති බවයි. මාතර මහරෝහලේදී රෝහල් පොලීසිය හේමසිරි මහතාගෙන් සිද්ධිය පිළිබඳ තොරතුරු විමසා සටහන් කර ගන්නා ලදි.

වගකිවයුතු පොලිස් නිළධාරියෙකුගෙන් තමන්ට සිදු වූ මෙම බරපතල අසාධාරණයෙන් පීඩිතව කර කියා ගැනීමට දෙයක් නොමැතිව අසරණව සිටි හේමසිරි මහතාට රයිට් ටු ලයිෆ් මානව හිමිකම් සංවිධානය පිළිබඳව දැනගැනීමට ලැබෙන්නේ අහම්බයෙන් මෙනි. ඒ අනුව, රයිට් ටු ලයිෆ් ආයතනයේ මගපෙන්වීම යටතේ සිද්ධිය පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට, ජාතික පොලිස් කොමිසමට පැමිණිලි ඉදිරිපත් කරන ලදී. එමෙන්ම, සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක SCFR 12/2010 යටතේ වර්ෂ 2010 ජනවාරි මස 11 වන දින මූලික අයිතිවාසිකම් නඩුවක් ද ගොනු කරනු ලැබීය.

එසේම, ඒ වනවිට සිද්ධිය සම්බන්ධයෙන් සැකකාර පොලිස් ස්ථානාධිපති කමල් අමරසිංහ මහතාට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ මූලික විමර්ශන විභාග කිරීම ආරම්භ කොට තිබුණි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙහි පැමිණිල්ල මෙහෙයවනු ලැබීය. මහේස්ත්‍රාත් අධිකරණයක් තුළ මෙවැනි මූලික විමර්ශනයක් විභාග කොට මහාධිකරණයේ අධිචෝදනා ගොනු කිරීමට අවුරුදු ගණනාවක් ගත වීම ලංකාවේ අධිකරණ නඩු කාර්යය පටිපාටි සම්ප්‍රදාය තුළ සාමාන්‍ය තත්ත්වයකි. නමුත්, රයිට් ටු ලයිෆ් ආයතනයෙන් ලබා දුන් නීති ආධාර යටතේ පැමිණිල්ල සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ නීතිඥවරුන්ද කරුණු ඉදිරිපත් කිරීම නිසා මෙම මූලික විමර්ශනය යම් ප්‍රමාණයකට කාර්යක්ෂම කර ගෙන, වර්ෂ 2013 දෙසැම්බර් මස 12 වන දින තරම් කෙටි කාල සීමාවක් තුළදී ස්ථානාධිපති කමල් අමරසිංහට විරුද්ධව මාතර මහාධිකරණයේ නඩු අංක HC 57/2014 යටතේ අධිචෝදනා ගොනු කිරීමට හැකිවිය.

ලංකාවේ අපරාධ නීතියට අනුව සිද්ධිය දෙස බැලීමේදී දණ්ඩ නීති සංග්‍රහයේ 311 වන වගන්තියට අනුව, හේමසිරි මහතාට සිදු කළ පහරදීම බරපතල තුවාල කිරීමක් යටතට වැටේ. එසේම එහි 312 වන වගන්තිය ප්‍රකාරව මෙය කැමැත්තෙන්ම තුවාල සිදු කිරීමක් යටතට වැටේ. මෙම වැරදි වලට එරෙහිව ලබා දෙන දඬුවමේ ස්වභාවය සහ ප්‍රමාණය 314 සිට 329 දක්වා වගන්ති වලින් දක්වේ. ඒ අනුව බැලීමේදී මෙම සිද්ධියට අදාළව ලබා දිය යුතු දඬුවම් ප්‍රමාණය 314 වන වගන්තිය යටතේ හෝ 316 වන වගන්තිය යටතේ තීරණය කළ යුතු බව නිරීක්ෂණය වේ. කෙසේ වුවද, අධිකරණය තීරණය කරනු ලබන දඬුවමේ ස්වභාවය සහ ප්‍රමාණය දෙපාර්ශවයේ නීතිඥවරුන් ඉදිරිපත් කරනු ලබන කරුණු, සාක්ෂි වල සාක්ෂිමය වටිනාකම මත දෝලනය වන්නකි. එහෙත් මේ කුමන ආකාරයෙන් හෝ දඬුවම් ලැබීමට චූදිතයා අදාළ අපරාධය සිදු කළ බවට සාධාරණ සැකයකින් තොරව ඔප්පු විය යුතුය.

මේ මහාධිකරණ නඩුවේ අධිචෝදනා ගොනුකර ඇත්තේ දණ්ඩනීති සංග්‍රහයේ 316 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවටය. එම 316 වන වගන්තිය අනුව, බරපතල තුවාල සිදු කරන තැනැත්තෙකුට අවුරුදු 07 දක්වා කාලයක දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකටද යටත් විය යුතුය.

කෙසේ වුවද, මේ මහාධිකරණ නඩු විභාගය ආරම්භ වූ අවස්ථාවේ සිට නීතිපති දෙපාර්තමේන්තුව පැමිණිල්ල මෙහෙයවනු ලැබූවද, රයිට් ටු ලයිෆ් ආයතනයේ නීති ආධාර යටතේ පෞද්ගලික නීතිඥවරුන්ගේ සහභාගීත්වය ද පැමිණිල්ල ලබා දීමට කටයුතු කරන ලදී. එම නිසා මෙම නඩු විභාගය අවුරුදු 03 ක් වැනි කෙටි කාල සීමාවක් තුළදී අවසාන කොට 2016.11.29 වන දින චූදිතට සාධාරණ සැකයෙන් තොරව වැරදිකරු කරමින් තීන්දුව ලබා ගැනීමට හැකි වීම විශාල ජයග්‍රහණයකි.

නමුත්, මෙහි මහාධිකරණ තීන්දුව දෙස බැලීමේදී නිරීක්ෂණය වන්නේ චූදිතට දඬුවම් ලබා දී ඇත්තේ දණ්ඩ නීති සංග්‍රහයේ 314 වන වගන්තිය යටතේ බවයි. එම 314 වන වගන්තිය අනුව, කැමැත්තෙන්ම තුවාල සිදු කරන තැනැත්තෙකු අවුරුද්දක් දක්වා කාලයක් දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් එක් දහස දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකෙන්ම දඬුවම් කළ යුතුය. මේ යටතේ මහාධිකරණය චූදිතට නියම කර ඇති දඬුවම වන්නේ රුපියල් 1000 ක (දහසක) දඩයක් පමණි.

මේ වනවිට, මෙම සිද්ධිය සම්බන්ධයෙන් හේමසිරි මහතා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ තවමත් විභාග වෙමින් පවතී.

මෙහිදී, කමල් අමරසිංහ පොලිස් ස්ථානාධිපතිවරයාගේ ක්‍රියාකලාපය 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ ද දඬුවම් ලැබිය යුතු වරදකි. එම පනත ප්‍රකාරව මහාධිකරණයේ අධිචෝදනා ගොනු කළ හැක්කේ නීතිපතිවරයාට පමණි. නමුත් නීතිපතිවරයා මෙම වධහිංසා පනත යටතේ ක්‍රියාත්මක වී නොමැති නිසා මේ පනත යටතේ වින්දිතයාට හිමි අයිතිවාසිකම් ඛණ්ඩනය වී ඇති බව නිරීක්ෂණය වේ. නීතිපතිවරයා මෙම වධහිංසා පනතේ විධිවිධාන මගහරිමින් කටයුතු කිරීම

මෙම වධහිංසා පනත පැනවූ ව්‍යවස්ථාදායකයේ චේතනාවට අභියෝග කිරීමක් නොවන්නේද යන ප්‍රශ්නාර්ථය මෙහිදී නිතැතින්ම පැන නගින්නකි.

(මෙම නඩුවේ තීන්දුව පහත සබැඳියාව හරහා ඔබට ලබා ගැත හැක. [http://www.right2lifelanka.org/new/what](http://www.right2lifelanka.org/new/what) we do/education/land mark cases/hemasiri's case)

02. තරුණයෙකුගේ ඇසක් අහිමි කළ පිටබැද්දර පොලීසිය

ගාල්ල මඩවලමුල්ල පදිංචි D.G. අසන්ත අරවින්ද, වයස අවුරුදු 23 ක පමණ තරුණයෙකි. වර්ෂ 2008 පෙබරවාරි 28 වන දින තම ජංගම දුරකතනයට ලැබුණු ඇමතුමක් මත ඔහු තම යතුරුපැදියෙන් පිටබැද්දර පිහිටි තම ඥාතියෙකුගේ නිවසට යාමට පිටත් විය. එම ගමන සඳහා ඔහුගේ මිතුරෙකු වන K.J. තුෂාර චමින්ද යන අයද සහභාගි විය. ගමන අතරතුරදී, එදින සවස 5.30 ට පමණ පාරේ නවතා තිබූ ට්‍රක් රථයකින් බැස පැමිණි රියදුරෙකු පාර හරහා මාරු වනවිට ඔහුගේ එක් අතක් මොවුන් පදවමින් සිටි යතුරු පැදියේ පැති කණ්නාඩියේ ගැටුණි. එයින් ට්‍රක් රථ රියදුරාට තුවාලයක් සිදු වී නොතිබුණත්, දෙපාර්ශවය අතර බහින්බස් වීමක් සිදු වී තිබේ. අනතුරුව නැවත ගමන් ආරම්භ කළ අසන්ත සහ ඔහුගේ මිතුරා කිලෝමීටර් කිහිපයක් ඉදිරියට ගමන් කරමින් සිටින විටදී පිටුපසින් පැමිණි පෙර කී ට්‍රක් රථය යතුරුපැදියේ පිටුපස වේගයෙන් හප්පා ඇත. මේ අනතුරින් යතුරුපැදිය විසි වී ගොස් බිම පතිත වී එහි ගමන් කළ අසන්ත සහ ඔහුගේ මිතුරා අනතුරට ලක් වී තිබුණි. ට්‍රක්රථ රියදුරා පලා ගොස් තිබුණි.

අනතුරුව, අසන්ත ත්‍රිරෝද රථයක් සෙවීමට ඉදිරියට ගියේ තම මිතුරා සමඟ රෝහල වෙත යාම පිණිසය. එවිටම පිටබැද්දර පොලිසියේ නම සඳහන් ජීප් රථයක් ඔහු අසළ නතර කළේය. එහි සිටි ට්‍රක් රථයේ රියදුරා, "උඹ නේද වාහනේ හැප්පුනේ?" යැයි කෑගසන ලදී. අනතුරුව, ජීප් රථයෙන් බැස ගත් ට්‍රක් රථ රියදුරා ඇතුළු පොලිස් නිළධාරීන් විසින් අසන්ත වෙත පහර දීමට පටන් ගෙන තිබේ. අමානුෂික අයුරින් සිදු කළ පහර දීම නිසා බිම ඇද වැටුනු අසන්ත ඉවසා ගත නොහැකිව බීමට වතුර ඉල්ලා ඇත. ඒ අවස්ථාවේදී ට්‍රක්රථ රියදුරා කෝප්පයකට යම් ද්‍රව්‍යයක් දමා ඔහු වෙත පානය කිරීමට දී ඇතත්, අසන්ත එය තම මුඛය තුළට ගත් වනම තම මුඛය පිළිස්සී යන බව ඔහුට දැනී ඔහු එය වහාම කෑගසමින් පිටතට විසි කර තිබේ. ඒ අත් කිසිවක් නොව ඔහුට පානය කිරීමට ලබා දී ඇත්තේ ඇසිඩ් වර්ගයක් බව ඔහු තේරුම් යාම නිසාය. නමුත්, ඉන් කෝපයට පත් ට්‍රක්රථයේ රියදුරා කෝප්පයේ ඉතිරිව තිබූ ඇසිඩ් අසන්තගේ මුහුණට දමා ගසා ඇත. එමගින් අසන්තගේ වම් ඇස සහ මුහුණේ වම්පස කොටස පිළිස්සීමෙන් දැඩි හානියක් සිදු විය.

මේ සියල්ල පිටබැද්දර පොලිස් නිළධාරීන් ඉදිරිපිටදී ඔවුන්ගේ අනුදැනුම මත සිදු වී තිබේ. අසන්තගේ මිතුරා වූ තුෂාර චමින්දව ද එම ස්ථානයට ඇද ගෙන පැමිණි පොලිස් නිළධාරීන් ඔහුට ද පහර දෙනු ලැබූ අතර, අනතුරුව දෙදෙනාවම පිටබැද්දර පොලීසිය වෙත ගෙන ගොස් ඇත. අනතුරුව, පොලිස් ස්ථානයේදී ද පොලිස් ස්ථානාධිපති කරුණාසේන මහතාගේ අනුදැනුම මත අසන්ත සහ තුෂාර යන අයට නැවත කෘෘර අමානුෂික අන්දමින් වධහිංසා පමුණුවා ඇත.

එපමණක් නොව, තමන්ගේ මෙම අත්තනෝමතික ක්‍රියාකලාපයෙන් මිදීමට පිටබැද්දර පොලිසියේ නිළධාරීන් විසින් අසන්ත සහ ඔහුගේ මිතුරා වන තුෂාර යන අයට එරෙහිව මංකොල්ලකෑම, ගිනි අවි ළඟ තබා ගැනීම, බෝම්බ ළඟ තබා ගැනීම යන චෝදනා ඉදිරිපත් කොට මහේස්ත්‍රාත් අධිකරණයේ බොරු නඩු කිහිපයක් පවරා ඔහු රක්ෂිත බන්ධනාගාර ගත කර තිබුනි.

පොලීසිය හෝ බන්ධනාගාරය විසින් නිසි ප්‍රතිකාර සඳහා අසන්තව ඉක්මණින් රෝහල වෙත යොමු නොකිරීම නිසා, ඇසිඩ් වැදී තුවාල වූ ඇස ඉතා අසාධ්‍ය තත්ත්වයට පත්වීමෙන් පසුව කොළඹ ඇස් රෝහල වෙත අසන්තව රිමාන්ඩ් සැකකරුවෙකු ලෙස යොමු කර තිබුණි. එහිදී ඔහු පරීක්ෂා කළ විශේෂඥ වෛද්‍යවරුන් මාසකට ආසන්න කාලයක තිස්සේ සුදුසු ප්‍රතිකාරයන් සඳහා රෝගියා යොමු නොකිරීම සම්බන්ධව බන්ධනාගාර නිලධාරීන්ට බැණ වැදීමෙන් පසුව ඇස

බේරාගැනීම සඳහා ශල්‍යකර්ම කිහිපයක් ඉතා කෙටි කාලයක් තුළ සිදු කර තිබේ. නමුත් ඒ සියල්ල අසාර්ථක වී ඇති අතර, අසන්තගේ වම් ඇස සම්පූර්ණයෙන් ඉවත් කිරීමට සිදුව ඇත.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව අනුව, කෲර, අමානුෂික වධහිංසා වලින් මිදීමට සෑම තැනැත්තෙකුටම අයිතියක් ඇත. එහි 13 (1) ව්‍යවස්ථාව අනුව, කිසිම තැනැත්තෙකු අත්තනෝමතික ලෙස සහ හේතුවක් නොදන්වා අත්අඩංගුවට නොගත යුතුය. 13 (2) වන ව්‍යවස්ථාව අනුව අත්අඩංගුවට ගනු ලැබූ සෑම තැනැත්තෙකුවම නීතියට අනුකූලව ආසන්නතම අදාළ අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය. මේවා මූලික අයිතිවාසිකම් වේ. එබැවින් මෙම අයිතීන් සුරක්ෂිත වන අයුරින් ක්‍රියා කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුතුය යන්න තහවුරු කිරීම රාජ්‍ය විධායක හා පරිපාලන ආයතන වල වගකීමකි. නමුත්, මෙහිදී පිටබැද්දර පොලීසිය එම වගකීම අත්තනෝමතික ලෙස උල්ලංඝනය කොට ඇති බව මනාව නිරීක්ෂණය වන කරුණකි.

එසේම මෙම සමස්ථ ක්‍රියාදාමය 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ නීතිපතිවරයා විසින් අධිචෝදනා ගොනුකළ යුතු වරදක් බව ද නිරීක්ෂණය වේ.

නමුත්, අසන්ත අරවින්දට මේ කිසිවකින් පිහිටක් නොලැබී, බොරු නඩු තොගයක් තමන්ට එරෙහිව විභාග වෙමින් පවතින අතරවාරයේ තම සෞඛ්‍ය තත්ත්වයද බරපතල ලෙස පිරිහීයමින් අන්ත අසරණව සිටීමට සිදු විය. එමෙන්ම පොලීසිය විසින් ඔහු නම ගිය අපරාධකාරයෙකු ලෙස හංවඩු ගසනු ලැබුවේ පොලීසිය වෙත මාධ්‍යවේදීන් ගෙන්වමින් පැවැත් වූ මාධ්‍ය සාකච්ඡාවකදීය. එම මාධ්‍ය සාකච්ඡාව සඳහා වූ වියදම් අසන්තගේ පියාගෙන් ලබාගෙන ඇති බව පසුව දැනගන්නට ලැබුණි.

අසන්ත කොළඹ ඇස් රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටිය දී අප සංවිධානයේ හිතවතෙකුට අහම්බෙන් මුණගැසී තිබූ අතර, ඔහුගේ මාර්ගයෙන් අසන්තගේ පියා ඇතුළු පවුලේ සියලුදෙනා අප ආයතනය වෙත පැමිණ, අවශ්‍ය මූලික පියවර දින 2 ක් ඇතුළත දී ගන්නා ලදී. ඒ වනවිටත් සිද්ධියට මාස 2 ක පමණ කාලයක් ගත වී තිබුනි.

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය මැදිහත් වී පොලිස්පතිවරයාට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම, පොලිස් කොමිසමට පැමිණිලි ඉදිරිපත් කළ අතර, අසන්තට එරෙහිව දමා තිබූ බොරු නඩු ඉවත් කර ගැනීමේ අරමුණෙන් නීති ආධාර ලබා දීම යටතේ පෞද්ගලික නීතිඥවරුන් ඔහු වෙනුවෙන් ලබා දෙන ලදී. ඒ යටතේ, මේ වනවිට මංකොල්ලකෑම් සම්බන්ධයෙන් දමා තිබූ බොරු නඩු 2 ක් වන, නඩු අංක 39597 සහ B/432 යන නඩු වලින් අසන්ත අරවින්දව නිදොස් කොට නිදහස් කර ගැනීමට හැකි විය.

ඊට අමතරව, රයිට් ටු ලයිෆ් ආයතනයේ නීති ආධාර යටතේ පිටබැද්දර පොලිසියේ ස්ථානාධිපති ඇතුළු වගකිවයුතු නිළධාරීන්ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක SCFR 26/2009 යටතේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් 2009 ජනවාරි 06 වන දින ගොනු කිරීමට හැකි විය. මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමේදී එය අදාළ සිද්ධිය සිදු වී මසක් ඇතුළත ගොනු කළ යුතුය. නමුත් එම කාලය තුළ ගොනු කිරීමට නොහැකි වුවහොත් අදාළ සිද්ධිය සිදු වී මාසයක් තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කොට ඇත්නම්, එම පැමිණිල්ල භාරගෙන එම කොමිසම විමර්ශන සිදු කෙරෙමින් පවතී නම්, පෙර සඳහන් කළ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව ගොනු කළ යුතු මාසයක කාල සීමාව අදාළ නොවේ. මෙහිදී අසන්තගේ පියා විසින් මාසයක කාලය තුළ කොමිසමට පැමිණිලිකර තිබූ නිසා මෙම ක්‍රමය භාවිතා කිරීමට සිදු විය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග වනවිට මානව හිමිකම් කොමිසමේ සහ පොලිස් කොමිසමේ ද මීට අදාළ පැමිණිලි විමර්ශනය වෙමින් පැවතුනි. ඊට අදාළ නීති ආධාර සහ නීතිඥ නියෝජනය රයිට් ටු ලයිෆ් ආයතනයේ මගපෙන්වීම යටතේ සිදුවුණි. ඒ අනුව, මානව හිමිකම් කොමිසම ඉදිරියේ විභාග වූ පැමිණිල්ල ද ජය ගැනීමට හැකි විය. ඒ යටතේ, රුපියල් 5000

ක වන්දියක් ගෙවීමට මානව හිමිකම් කොමිසම නිර්දේශ නිකුත් කර ඇත. එසේම, ශ්‍රී ලංකා පොලිස් කොමිසම ඉදිරියේ විභාග වූ පැමිණිල්ල ද ජය ගැනීමට හැකිවිය. ඒ යටතේ, වගකිව යුතු පොලිස් නිළධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා බවත්, දණ්ඩ නීති සංග්‍රහය සහ 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ ක්‍රියාකිරීමට ද කටයුතු යොදන බව දන්වා ඇත. නමුත්, මේ දක්වා නීතිපතිවරයා විසින් වධහිංසා පනත යටතේ මේ සිද්ධිය පිළිබඳව අධිචෝදනා ගොනු කර නොතිබීම ප්‍රශ්නාර්ථයකි.

මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වූ මූලික අයිතිවාසිකම් පෙත්සම 2016.08.02 වන දින ජයග්‍රාහී ලෙස නිමා කිරීමට හැකියාව ලැබුණි. මේ යටතේ පිටබැද්දර පොලිස් ස්ථානාධිපති කරුණාසේන නමැති අය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 12 (1) ව්‍යවස්ථා යටතේ අසන්ත අරවින්දට හිමිවිය යුතු මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කොට ඇති බව ඔප්පු වූ අතර, එබැවින් ඊට එරෙහිව අසන්ත අරවින්ද වෙනුවෙන් රුපියල් ලක්ෂ දෙකක මුදලක් රජය විසින් ගෙවිය යුතු බවට නියෝග කරන ලදී.

නමුත්, මේ තීන්දුවේදී ප්‍රකාශ වූයේ සිද්ධියට වගකිව යුතු බවට චෝදනා එල්ල කර තිබූ 01 සිට 10 දක්වා වන වගඋත්තරකාර පොලිස් නිළධාරීන්, ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයාගේ අනුදැනුම මත, ඔහුගේ උපදෙස් යටතේ ක්‍රියාත්මක වීමට සිදු වී තිබෙන නිසා ඔවුන් වෙත සිද්ධිය පිළිබඳ වගකීමක් පැවරිය නොහැකි බවයි. මෙම නඩුව නීතිඥ උපුල් කුමරප්පෙරුම මහතා විසින් ගොනු කරනු ලැබීය.

(මෙම සිද්ධියට සම්බන්ධ පොලිස් ස්ථානාධිපතිවරයා, මෙම සිද්ධිය සම්බන්ධව පොලීසිය විසින් පැවැත් වූ විනය පරීක්ෂණයකට මුහුණ දෙමින් සිටිය දී හදිසි හෘදයාබාදයක් හේතුවෙන් රෝහල් ගත කිරීමෙන් අනතුරුව මියගොස් තිබුණි. මෙම නඩුවේ තීන්දුව පහත සබැඳියාව හරහා ඔබට ලබා ගත හැක. http://www.right2lifelanka.org/new/what we do/education/land mark cases/asantha aravinda’s case)

03. නම් පැටලැවිල්ලක් නිසා ජීවිතයක් බිලිගත් වත්තල පොලීසිය

2002 අවුරුද්දේ දිනයක වත්තල පොලිස් ස්ථානය වෙත ලැබුණු පණිවුඩයකින් දැක්වුණේ, ජෙයරාජ් නැමැත්තෙකු ත්‍රිපුද්ගල මනුෂ්‍ය ඝාතනයක් සිදුකර පලාගොස් ඇති බවයි. මෙම පුද්ගලයා වත්තල ප්‍රදේශයේ පදිංචි අයෙකු බවත් ඉන් කියැවී තිබුණි. වහාම ක්‍රියාත්මක වූ වත්තල පොලීසියේ නිලධාරීන් මෙම සැකකාර පුද්ගලයා සොයා මෙහෙයුමක් ආරම්භ කළේය. මෙහිදී පොලිස් නිලධාරීන් වෙත පැහැදිලි තොරතුරක් නොතිබූ හෙයින් වත්තල ප්‍රදේශයේ සිටින එම නම සහිත තැනැත්තෙකු කෙරෙහිම විමසිල්ලෙන් පසු විය.

වත්තල, මාකේවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වූ ජෙරාඩ් මර්වින් පෙරේරා තිදරු පියෙකු වූ අතර, කොළඹ වරායේ, නැව් තටාකාංගනයේ අරක්කැමියෙකු වශයෙන් සේවයේ නිරත විය. මොහුගේ නම තමන් සොයන සැකකරුවාගේ නමට බොහෝ සෙයින් සමාන බව දැනගත් වත්තල පොලීසියේ නිලධාරීන් අත්තනෝමතික අයුරින් ජෙරාඩ් මර්වින් පෙරේරාව අත්අඩංගුවට ගනු ලැබීය.

ඔහුව අත්අඩංගුවට ගෙන වත්තල පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස්, ඔහුගෙන් ප්‍රශ්න කිරීම ආරම්භ කළහ. පොලීසිය තමන්ව ගෙන ආවේ කුමන හේතුවක් මතද යන්න පිළිබඳව කිසිදු තොරතුරක් නොදත් ජෙරාඩ්, පොලීසියේ මෙම ප්‍රශ්න කිරීම් හමුවේ නිරුත්තර විය. එහිදී වත්තල පොලිසියේ ස්ථානාධිපති සේන සුරවීර, උප පොලිස් පරීක්ෂක සුරේෂ් ගුණසේන, උප පොලිස් පරීක්ෂක රේණුක සහ නලින් ජයසිංහ, පොලිස් කොස්තාපල් පෙරේරා යන අය ජෙරාඩ්ගේ දෑස් ආවරණය කොට, දෑත් එකට බැඳ බාල්කයක එල්ලා, යකඩ හා ලී පොලු වලින් කෲර හා අමානුෂික ලෙස පහර දුන්හ. අනතුරුව ඔහුව පොළොව මත මුනින් අතට පෙරලා ඔහුගේ දෑත් දැල්වූ ගිනිකූරු වලින් පිළිස්සූහ. කෙතරම් වධහිංසා සිදු කළත් ජෙරාඩ් නිරුත්තර වූයේ ඔහු කිසිවක් නොදැන සිටි නිසාය.

කෙසේ වුවද තමන් අත්අඩංගුවට ගෙන වධහිංසා පමුණුවා ඇත්තේ වැරදි පුද්ගලයෙකුට බව පොලිස් නිලධාරීන්ට දැන ගන්නට ලැබුණි. තමන්ට වැරදීමක් සිදු වී ඇති බව දැනගත් වහාම, වත්තල පොලීසිය ජෙරාඩ්ව මුදා හැරීමට කටයුතු කළේය. ජෙරාඩ්ව අත්අඩංගුවෙන් මුදා හරින අවස්ථාවේදී ඔහු ඉතා අසාධ්‍ය තත්ත්වයේ පසුවිය. ඒ අනුව, ඔහුගේ බිරිඳ හා සොහොයුරා ඔහුව ගම්පහ ආයුර්වේද රෝහල වෙත රැගෙන ගියහ. එහිදී එහි වෛද්‍යවරුන් ඔහුව පරීක්ෂා කර බලා කියා සිටියේ ජෙරාඩ්ගේ තත්ත්වය ඉතා අවදානම් නිසා ඔහුව වහාම හොඳ රෝහලකට රැගෙන යන ලෙසයි. ඉන් අනතුරුව ජෙරාඩ්ව කොළඹ නවලෝක රෝහලට ඇතුළත් කළ අතර, එහි දැඩිසත්කාර ඒකකයේ සති කිහිපයක් නේවාසිකව ප්‍රතිකාර සිදු කරන ලදී. අනතුරුව ජෙරාඩ්ව කොළඹ ජාතික රෝහලට ඇතුළත් කළ අතර, එහිදී ද නේවාසිකව ප්‍රතිකාර කරන ලදි.

ජෙරාඩ් රෝහල් ගතව ප්‍රතිකාර ගන්නා අතරතුර මෙම සිද්ධිය සම්බන්ධව සැලවූ මානව හිමිකම් නීතිඥයෙකු වූ සංජීව වීරවික්‍රම මහතා මෙම සිද්ධිය සම්බන්ධව හොංකොං හි පිහිටි ආසියානු මානව හිමිකම් කොමිසම වෙත සැළකර සිටියේය. ඔවුන්ගේ ද උපදෙස් අනුව ක්‍රියාත්මක වූ වීරවික්‍රම මහතා ජෙරාඩ් රෝහල් ගතව සිටියදීම ඔහුගේ අයිතිවාසිකම් වෙනුවෙන් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරනු ලැබීය.

ඉතා ආන්දෝලනාත්මක සිදුවීමක් වූ මෙම සිද්ධිය සම්බන්ධව ආසියානු මානව හිමිකම් කොමිසම හා එක්ව ශ්‍රී ලංකාව තුළ වධහිංසාවට එරෙහිව ගොඩනගා තිබූ අප සංවිධානය ඇතුළු

සංවිධාන 6 කින් සමන්විත වධහිංසාවට එරෙහි ජනසංධානය ලෙස ක්‍රියාකාරකම් රාශියක් මේ සම්බන්ධව ගනු ලැබීය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකරනු ලැබූ මූලික අයිතිවාසිකම් නඩුවේ තීන්දුව 2003.04.04 වන දින ලබා දෙමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ කෲර, අමානුෂික, අවමන්සහගත වධහිංසාවක් සිදු කර ඇති බවටත්, 13 (1) සහ 13 (2) ව්‍යවස්ථා ප්‍රකාරව අත්තනෝමතිකව අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් නොකරමින් අත්තනෝමතික ලෙස රඳවා තබා ගෙන ඇති බවත්, ඒ තුළින් ජෙරාඩ් පෙරේරාට ලැබිය යුතු මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් තීරණය කරනු ලැබීය. ඒ අනුව, 01 වන වගඋත්තරකරු විසින් රුපියල් 70,000 ක්ද, 03 වන වගඋත්තරකරු විසින් රුපියල් 40,000 ක්ද, 06 වන වගඋත්තරකරු විසින් රුපියල් 20,000 ක්ද, 07 වන වගඋත්තරකරු විසින් රුපියල් 20,000 ක්ද සහ රජය විසින් රුපියල් 650,000 ක්ද වන්දි ලෙස පෙත්සම්කරුට ගෙවිය යුතු බවත් නියෝග කළහ.

එමෙන්ම, ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් පෙත්සමින් ඉල්ලා තිබුණේ සිද්ධියට වගකිව යුතු පොලිස් නිළධාරීන්ට එරෙහිව 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ මහාධිකරණයේ අධිචෝදනා ගොනු කිරීමට නීතිපතිවරයාට නියෝග කරන ලෙසයි. ඒ අනුව, එම ඉල්ලීම පිළිගත් ශ්‍රේෂ්ඨාධිකරණය, තම තීන්දුව දීමේදී ප්‍රකාශ කර සිටියේ 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ නීතිපතිවරයා විසින් වගඋත්තරකරුවන්ට නඩු පැවරීමට ක්‍රියා කළ යුතු බවයි.

ඒ අනුව, නීතිපතිවරයා විසින් 2003 වසරේ වත්තල පොලිස් ස්ථානයේ සේවයේ නියුතුව සිටි සුරේෂ් ගුණසේන ඇතුළු පොලිස් නිළධාරීන් හය දෙනෙකුට විරුද්ධව 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ මීගමුව මහාධිකරණයේ නඩු අංක HC 326/2003 යටතේ නඩු පවරනු ලැබීය. මෙම වධහිංසා නඩුව විභාග වීම ආරම්භ වූ විට විත්තිකරුවන්ට නීතිඥයෙකුගෙන් උපදෙස් ලැබී ඇත්තේ මෙම නඩුවෙන් නිදහස් වීමට නම් වධහිංසාවට ලක් වූ ජෙරාඩ්ගේ සාක්ෂිය අධිකරණය වෙත ලබා දීම වැළැක්විය යුතු බවයි. එම උපදෙස් අනුව ක්‍රියාත්මක වූ විත්තිකරුවන් ජෙරාඩ්ව හමුවීමට පැමිණ කියා සිට ඇත්තේ මෙම නඩුව සමථයකට පත් කර ගැනීමට සහයෝගය දෙන ලෙසත්, ඒ වෙනුවෙන් රුපියල් ලක්ෂ තුනක මුදලක් ලබා දෙන බවත්ය. නමුත් ජෙරාඩ් මීට එකඟ නොවීය.

2004 නොවැම්බර් මස 22 වන දින ජෙරාඩ්ට මහාධිකරණයේ සාක්ෂි දීමට නියමිත තිබුණි. මේ වනවිට 2004 නොවැම්බර් මස 21 දින උදාවී තිබුණි. සුපුරුදු පරිදි උදෑසන අවදි වූ ජෙරාඩ් තම රැකියාව බලා නිවසින් පිටත් විය. මේ වනවිට වධහිංසා නඩුවේ විත්තිකරුවකු වන සුරේෂ් ගුණසේන ජෙරාඩ්ව ඝාතනය කිරීමට සැලසුම් කර සිටියේ ජෙරාඩ්ගේ සාක්ෂි අධිකරණය වෙත ලබා දීම වැළැක්වීමට වෙනත් විකල්පයක් නොතිබූ හෙයිනි. ඒ අනුව, එදින ජෙරාඩ් පෙරේරා නගරය වෙත පැමිණ පොදු මගී ප්‍රවාහන බස් රථයකට ගොඩවූයේ රැකියාව සඳහා යාමේ අරමුණෙනි. ඔහු පසුපස සුරේෂ් ගුණසේන සහ ඔහු විසින් මෙහෙයවන ලද අජිත් නිශාන්ත නැමැත්තෙකු ලුහුබඳිමින් පැමිණ එම බස්රථයටම ගොඩ විය. මේ කිසිවක් ජෙරාඩ් දුටුවේ නැත. එක්වරම බස්රථය දෙදරවමින් වෙඩි හඬක් ඇසිණි. සුරේෂ් ගුණසේන විසින් මෙහයෙවන ලද අජිත් නිශාන්ත නම් තැනැත්තෙකු විසින් ජෙරාඩ් මර්වින් පෙරේරාට වෙඩි තබා ඝාතනය කොට ඇති බව හෙළි විය.

මේ ඝාතනය සම්බන්ධයෙන් සුරේෂ් ගුණසේන සහ අජිත් නිශාන්ත යන අයව අත්අඩංගුවට ගත් අතර, එම ඝාතනය පිළිබඳ මූලික විමර්ශන මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ ආරම්භ විය. මේ වනවිට දරු තිදෙනා සමග තනි වූ ජෙරාඩ්ගේ බිරිඳ වන පද්මා වික්‍රමරත්න මහත්මිය විශාල ව්‍යාකුලත්වයකට පත් වී තිබුණි. ඇයගේ ආරක්ෂාව පිළිබඳව විශාල ගැටළු ඇති විය. නමුත් වධහිංසාවට එරෙහි ජනසංධානයේ සහෝදර සංවිධානවල සහායෙන් ඇයට ආරක්ෂාව, නීතිමය උපදෙස් හා නීතිඥ සහාය, අනෙකුත් දිරිගැන්වීම් සමග කටයුතු කිරීම නිසා දරුවන් සමඟ ජීවිතය ගොඩනගා ගැනීමට ඇයට හැකි වූ අතර, නඩු ජයග්‍රහණ ලබා ගැනීමට ඉන් හැකි විය.

එසේම මෙහිදී ජෙරාඩ් පෙරේරාව වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් වූ මහේස්ත්‍රාත් අධිකරණයේ මූලික විමර්ශන ඉතා ඉක්මණින් අවසන් කොට, 2005 වර්ෂයේදී මීගමුව මහාධිකරණයේ නඩු අංක HC 445/2005 යටතේ චූදිතයන් දෙදෙනාට එරෙහිව අධිචෝදනා ගොනු කරනු ලැබීය.

මේ වනවිට මීගමුව මහාධිකරණයේ ජෙරාඩ් පෙරේරාට සිදු වූ අයුක්තිය වෙනුවෙන් නඩු දෙකක් විභාග වෙමින් පැවතිණි. එනම්, නඩු අංක HC 326/2003 යටතේ පැවරී තිබූ වධහිංසා නඩුව සහ නඩු අංක HC 445/2005 යටතේ ජෙරාඩ්ගේ ඝාතනය සම්බන්ධව මිනීමැරුම් නඩුවයි.

වර්ෂ 2008 දී වධහිංසා නඩුවේ විභාගය අවසන් වී තීන්දුව දෙනු ලැබීය. එහිදී මහාධිකරණ විනිසුරු J.M.T.M.P.U. තෙන්නකෝන් මැතිණිය තම තීන්දුව දෙමින් ප්‍රකාශ කළේ, වර්ෂ 2003.06.03 වන දින ජෙරාඩ් මර්වින් පෙරේරා වත්තල පොලිසියේදී ශාරීරික වධහිංසාවන්ට ලක් වී තිබෙන නමුත් ඔහුව වධහිංසාවට ලක් කොට ඇත්තේ මෙම නඩුවේ නම් කොට ඇති විත්තිකරුවන් විසින් බවට සාධාරණ සැකයෙන් ඔබ්බට අධිකරණයේ දී ඔප්පු වී නොමැති බවයි. ඒ අනුව සියලුම විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කරන බවට නියෝග නිකුත් කෙරුණි.

ජෙරාඩ්ගේ සිද්ධිය සම්බන්ධයෙන් මුල සිටම අවධානයෙන් සිටි ආසියානු මානව හිමිකම් කොමිසම ඇතුළු වධහිංසාවට එරෙහි ජන සංධානය, ඉහත වධහිංසා නඩුවෙන් ලැබුණු තීන්දුවෙන් යුක්තිය ඉටු නොවුණු බැවින්, එම තීන්දුව අභියෝගයට ලක් කළ යුතු බව තීරණය කළහ. 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ නඩු පැවරිය හැක්කේද, එම නඩු වලට අදාළ තීන්දු වලට එරෙහිව අභියාචනා ගොනු කළ හැක්කේද නීතිපතිවරයාට බැවින්, නීතිපතිවරයාගෙන් මීට එරෙහිව අභියාචනා ගොනු කරන ලෙස ඉල්ලීම් කරනු ලැබීය. නමුත් කොතෙකුත් ඉල්ලීම් කරනු ලැබුවත් නීතිපතිවරයා ඊට අදළ ක්‍රියාමාර්ග ගනු ලැබුවේ නැත.

අනතුරුව, ආසියානු මානව හිමිකම් කොමිසමේ මග පෙන්වීම යටතේ ජෙරාඩ්ගේ බිරිඳ වන පද්මා වික්‍රමරත්න අගතියට පත් පාර්ශවයේ අභියාචක ලෙස ඉදිරිපත් වෙමින් ඉහත මහාධිකරණ තීන්දුවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් නඩු අංක CA 5/2008 යටතේ ගොනු කිරීමට හැකි විය. එම නඩුවේ තීන්දුව 2012.10.18 වන දින ප්‍රදානය කරමින් අභියාචනාධිකරණය ප්‍රකාශ කළේ මීට අදාළ මහාධිකරණ තීන්දුව දෝශ සහගත එකක් බව නිරීක්ෂණය වන නිසා නැවත එම නඩුව මහාධිකරණයේ මුල සිට විභාග කිරීම ආරම්භ කළ යුතු බවයි.

එම අභියාචනාධිකරණයේ තීන්දුවට එරෙහිව විත්තිකරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කළහ. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනාධිකරණ තීන්දුව නැවත තහවුරු කරමින් ප්‍රකාශ කළේ විත්තිකරුවන්ට එරෙහිව 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ මීගමුව මහාධිකරණයේ මුල සිට නඩුව නැවත වතාවක් විභාග කළ යුතු බවයි. එසේම මෙම තීන්දුවෙන් පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවට අළුතින් සාක්ෂිකරුවන් එකතු කිරීමටද නීතිපතිවරයාට අවස්ථාව ලබා දී ඇත. එසේම වැඩිදුරටත් ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කොට ඇත්තේ 2003 වසරේ සිට මේ දක්වා මෙම නඩු විභාගයට දීර්ඝ කාලයක් ගත වී ඇති බැවින් 2014 දෙසැම්බර් මස අවසාන වීමට පෙර මෙම නඩුව අසා නිම කළ යුතු බවයි. කරුණු එසේ වුවද නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයේ හිඟකම, නඩු වලට නිසියාකාරව කරුණු ගොනු කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීම, නොසැලකිලිමත්භාවය, සාධාරණ හේතු නොමැතිව අනවශ්‍ය ආකාරයට නඩු කල් දැමීම යනාදී හේතු මත ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට අනුකූලව ක්‍රියා කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවට නොහැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වන විට 2017 වර්ෂයෙන් අඩක් ගෙවී ගොස් තිබුණද, මෙම වධහිංසා නඩු විභාගය අවසන් වී නොමැති අතර තවමත් මීගමුව මහාධිකරණයේ විභාග වෙමින් පවතී.

මෙම වධහිංසා නඩුව එසේ විභාග වෙමින් තිබිය දී ජෙරාඩ්ව වෙඩි තබා ඝාතනය කිරීමට අදාළ නඩු අංක HC 445/2005 දරණ මිනීමැරුම් නඩුව මීගමුව මහාධිකරණයේ අවුරුදු 10 ක්

තිස්සේ විභාග වෙමින් පැවතුණි. මෙම විභාගය වසර 10 ට පසු, එනම් 2015 අවුරුද්දේදී අවසාන විය. ඒ අනුව, 2015 ජුනි මස 22 වන දින තීන්දුව දෙමින් මහාධිකරණය ප්‍රකාශ කළේ මෙම නඩුවේ චූදිතයින් වන සුරේෂ් ගුණසේන විසින් අජිත් නිශාන්ත යන අයට ජෙරාඩ් මර්වින් පෙරේරගෙ මරණය සිදු කිරීමට අනුබල දීමේ පොදු පරමාර්ථයකින් යුතුව එකගවීමෙන් මිනීමැරීමේ කුමන්ත්‍රණයේ වරද සිදු කළ බවත්, එහෙයින් විත්තිකරු දණ්ඩ නීති සංග්‍රහයේ 113 වන වගන්තිය හා 102 වන වගන්තිය සමඟ කියවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තිය යටතේ මිනීමැරීමේ වරදට වරදකරු වන බවත්, අජිත් නිශාන්ත යන විත්තිකරු විසින් ජෙරාඩ් පෙරේරාගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තිය යටතේ මිනීමැරීමේ වරදට වරදකරු වන බවත්ය.

ඒ අනුව, මහාධිකරණයේ විභාග වූ මිනීමැරුම් නඩුවෙන් සුරේෂ් ගුණසේන සහ අජිත් නිශාන්ත යන විත්තිකරුවන් දෙදෙනාටම මරණ දඬුවම ලබා දෙනු ලැබීය. (මෙම නඩුවේ තීන්දුව පහත සබැඳියාව හරහා ඔබට ලබා ගැත හැක. http://www.right2lifelanka.org/new/what we do/education/land mark cases/gerad mervin perera’s case)

04. කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ස්ත්‍රී දූෂණය

කුරුණෑගල, බන්නැග්ගල, ප්‍රදේශයේ පදිංචිව සිටි නිලූකා ක්‍රිශාන්ති, වයස අවුරුදු 23 ක් වූ එක් දරු මවකි. ක්‍රිශාන්ති යහපත් පවුල් ජීවිතයක් ගත කළ ගුණගරුක මවක් මෙන්ම යහපත් බිරිඳක් ද වූවාය. ඇයගේ පවුල් ජීවිතයට තිබූ එකම බාධාව වූයේ දුෂ්කර ආර්ථික තත්ත්වයයි. මීට විසඳුමක් ලෙස යහපත් ආර්ථික පසුබිමක් ඇති කර ගැනීමේ අරමුණින් විදේශ රැකියාවකට යාමට ඇයට සිත් විය. ඇය තම අදහස තම ස්වාමිපුරුෂයාට පැවසුවාය. ඔහුගේ එකඟත්වය ඊට ලැබුණු බැවින් විදේශ රැකියාවකට යාමට ඇය තුළ පැවති සිතුවිල්ල තහවුරු කර ගැනීමට හැකිවිය. ඒ අනුව, කුරුණෑගලට පිහිටි සමන් නමැති විදේශ රැකියා ඒජන්සියක් මාර්ගයෙන් ඇයට කුවේට් රටට ගෘහ සේවිකාවක් වශයෙන් සේවය කිරීමට පිටත් වීම සඳහා වීසා බලපත්‍ර ලැබුණි. ඒ අනුව වර්ෂ 2005 ඔක්තෝබර් 10 වන දින අළුයම කුවේට් රාජ්‍යය බලා ගුවන් ගතවීමට නියමිතව තිබිණි.

ඒ අනුව වර්ෂ 2005 ඔක්තෝබර් මස 09 වන දින නිලූකා තම සැමියා සමඟ රාත්‍රී 11.30 ට පමණ නිවසින් පිටත් වූයේ ගුවන්තොටුපළ වෙත යාමේ අරමුණෙනි. අනතුරුව ඔවුන් කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත පැමිණි අතර, එහිදී තම සැමියාට සමු දී නිලූකා ගුවන් තොටුපල පර්යන්තයට ඇතුළු වූවාය.

කිසිදා ගුවන්තොටුපළ වෙත නොව, කොළඹටවත් නොපැමිණි නිලූකා යම් කිසි තැති ගැන්වීමක සිටිමින්, ඊළඟට ගත යුතු පියවර ගැන කල්පනා කරමින් සිටිනා අවස්ථාවේ, "සමන් ඒජන්සියෙන් ආපු අය කවුද?" කියා ගුවන්තොටුපල ආරක්ෂක අංශයෙන් පැමිණි නිලධාරියෙකු විමසා තිබේ. එවිට නිලූකා මම කියා ඉදිරිපත් වී ඇති අතර, ඔහු විසින් ගමන් බලපත්‍රය ගෙන පරීක්ෂා කොට ඇයගේ ගමන් බලපත්‍රය ඔහු සන්තකයේ තබා ගනිමින් ඔහු සමග පැමිණෙන ලෙස ඇයට පවසා තිබේ.

ඒ අනුව නිලූකා, මර්වින් නිශ්ශංක නැමති එම නිලධාරියා පසුපස ගොස් ඇති අතර, අතර මගදී තවත් තැනැත්තන් දෙදෙනෙකු ඔහු හා එක් වී තිබේ. පසුව ඔවුන් නිලූකා සමග විදුලි සෝපනයෙන් ඉහළ මාලයට ගෙන ගොස් ඇති අතර, ඉහළ මාලයේ පිහිටා ඇති කාමරයක් වෙත ඇය ගෙන ගොස් තිබේ. එම කාමරය තුළ කොහු, ඉදල්, කෑන් තිබෙන බව දුටු නිලූකා, තමන්ට කරදරයක් වීමට යන බව හැඟී එක්වරම කෑ ගැසුවාය.

මෙවිටම මර්වින් නිශ්ශංක විසින් තමා ළඟ තිබූ පිහියක් ඉවතට ගෙන, නිලූකාගේ බෙල්ලට තබා, "කෑ ගැහුවොත් උඹව මරණවා", යනුවෙන් ප්‍රකාශ කොට බිය ගන්වන ලද අතර, ඔහු සමඟ සිටි අනෙක් පුද්ගලයා වීදුරුවකට යම් කුඩු වර්ගයක් දමා දියකර ඇයට බලෙන් පොවන ලද්දේ ඇයගේ කෑ ගැසීම මධ්‍යයේය. අනතුරුව නිලූකා සිහිසුන්ව බිම ඇද වැටුණු අතර, ඇයට සිහිය එනවිට තමන් බිම කාඩ්බෝඩ් කැබැල්ලක් මත වැතිර සිටින බවත්, තම උඩුකයට ඇඳ සිටි බ්ලවුස් එක බාගෙට ගලවා තිබූ බවත්, තම යටි කය නිර්වස්ත්‍රව තිබූ බවත් දුටුවාය. එසේම තම යෝනි ප්‍රදේශය තෙත් ස්වභාවයෙන් තිබෙන බව ඇයට දැනුණි.

ඇය වටපිට බැලීමේදී මර්වින් නිශ්ශංක යන අය කාමරය තුළ සිටින අයුරු දුටුවාය. තමා දූෂණයකට ලක් වී ඇති බව වටහා ගත් නිලූකා, මර්වින් නිශ්ශංක වෙත කෑ ගසා කියා සිටියේ, තමන්ට නිවසට යාමට අවශ්‍ය බවය. නමුත් මර්වින් ඇයට මරණීය තර්ජන සිදු කොට ඇයව පහත

මාලයට ගෙනවිත්, ගුවන් ගමනට අදාළ සියළුම කටයුතු ඔහු මැදිහත් වී සිදු කරමින්, ගුවන් යානය වෙත පිටත්වීම සඳහා බස් රථයට නංවා ඇති අතර එම බස්රථයට නිශ්ශංක නැග තිබේ. බස්රථයේ සිටි වෙනත් කිසිවෙකු සමඟ කතාබහ කිරීමට ඔහු නිලූකාට ඉඩ දී නොමැත. පසුව එම බස් රථය ගුවන් යානය අසළට පැමිණ නැවැත්වූ පසු නිලූකා ඇතුළු මගීන් ගුවන්යානයට ඇතුළු වී තිබේ. ගුවන් යානය තුළදී ඇයට ක්ලාන්ත ගතියක් ඇති වී වමනය ගිය මුත්, ඈ පත්ව සිටි අසරණ තත්ත්වය මත මේ සිදුවීම සම්බන්ධව ගුවන් සේවිකාවකට හෝ පැවසීමට ඇයට නොහැකි වී තිබේ.

පසුව ඇය කුවේට් රාජ්‍යයට ගිය අතර, එහිදී තමන් සේවය කිරීමට නියමිත නිවසට ගිය පසු ඇයට දිගින් දිගටම වමනය යාමට පටන් ගත් හෙයින් ඇයව එරට පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත යැවීමට එරට බලධාරීන් ක්‍රියා කොට ඇත. තානාපති කාර්යාලයේදී තමන් මුහුණ දුන් සිද්ධිය පිළිබඳව අකුරක් නෑර ප්‍රකාශ කළ නිලූකා, තමන්ට නැවත ආපසු ලංකාව වෙත යාමට අවශ්‍ය බව දන්වා සිටියාය.

ඒ අනුව, නිලූකා 2005 ඔක්තෝබර් 18 වන දින නැවත ලංකාවට පැමිණියාය. ලංකාවට පැමිණි විගස ඇයට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිළධාරියෙකුට මෙම සිද්ධිය පැවසීමෙන් අනතුරුව මේ සම්බන්ධව ගුවන්තොටුපල පොලීසිය වෙත පැමිණිලි කර ඇත. පොලීසිය විසින් ඇයව අධිකරණ වෛද්‍ය නිළධාරියෙකු වෙත ඉදිරිපත් කොට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගෙන තිබේ.

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයට මෙම සිද්ධිය දැන ගැනීමට ලැබෙන්නේ කටුනායක ගුවන්තොටුපල වාර්තාකරු රංජිත් ප්‍රනාන්ඩස් මහතාගෙනි. පසුව අප මේ සිද්ධිය පිළිබඳව පුළුල් ප්‍රචාරයක් ලබා දීමට ක්‍රියා කරනු ලැබූ අතර, නිලූකා වෙනුවෙන් නීති උපදෙස්, නීති ආධාර ලබා දීමත්, මනෝවිද්‍යාත්මක උපදේශණ ලබා දීමටත් කටයුතු කරන ලදි. ඒ අනුව, සිද්ධිය පිළිබඳව මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ සිදු කළ මූලික විමර්ශන කඩිනම් කිරීමේ අරමුණින් සහ වින්දිත පාර්ශවය වෙනුවෙන් සාධාරණය ඉටු කර ගැනීමේ අරමුණින් පෞද්ගලික නීතිඥ නියෝජනයක් ලබා දීම සිදුවිය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් මර්වින් නිශ්ශංක ඇන්තනී විත්තිකරු කරමින් නඩු අංක HC 162/2009 යටතේ දණ්ඩ නීති සංග්‍රහයේ 364 වන වගන්තිය යටතේ මීගමුව මහාධිකරණයේ අධිචෝදනා ගොනු කිරීමට හැකි විය. දණ්ඩ නීති සංග්‍රහයේ 364 වන වගන්තිය අනුව ස්ත්‍රී දූෂණයක් සිදු කරන තැනැත්තෙකුට අවුරුදු 20 දක්වා කාලයක්, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු මෙන්ම, ඔහු දඩයකටද යටත් විය යුතුය.

මීට අමතරව, විත්තිකරුගේ මෙම ක්‍රියාවට එරෙහිව දිලික්ත නීතිය යටතේ වන්දි ලබා ගැනීමට වින්දිත පාර්ශවයට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට අයිතියක් පවතී. එබැවින් මෙය පදනම් කර ගනිමින් රයිට් ටු ලයිෆ් ආයතනයේ නීති ආධාර හා මගපෙන්වීම යටතේ විත්තිකරුට එරෙහිව නිලූකා වෙනුවෙන් වන්දි නඩුවක් පවරන ලදි. මේ වනවිට එම නඩුව මීගමුව දිසා අධිකරණයේ නඩු අංක, 12242M යටතේ විභාග වෙමින් පවතී.

මීගමුව මහාධිකරණයේ පැවති ස්ත්‍රී දූෂණ නඩුව වර්ෂ 2016 අගෝස්තු 10 වන දින ජයග්‍රාහී ලෙස නිමා කර ගැනීමට හැකි විය. මේ අනුව, මේ නඩුවේ තීන්දුව ලබා දෙමින් මීගමුව මහාධිකරණයේ විනිසුරු පී. වික්‍රමසිංහ මැතිණිය ප්‍රකාශ කළේ, මර්වින් නිශ්ශංක ඇන්තනී නම් චූදිතට වසර 20 ක් බරපතල වැඩ සහිත සිර දඬුවම් නියම කරන බවත්, ඊට අමතරව රුපියල් 20,000 ක දඩ මුදලක් නියම කරන බවයි. එම දඩ මුදල නොගෙවන්නේ නම් තවත් වසර 01 ක ලිහිල් වැඩ සහිත සිර දඬුවමක් නියම කොට ඇත. එමෙන්ම මෙම නඩුවේ අගතියට පත් පාර්ශවයට රුපියල් 400,000 ක (ලක්ෂ හතරක) වන්දි මුදලක් ගෙවීමට නියම කර ඇත. මෙම වන්දි මුදල නොගෙවන්නේ නම් තවත් වසර 02 ක ලිහිල් වැඩ සහිත සිර දඬුවමක් නියම කර ඇත.

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ නිසි මගපෙන්වීම යටතේ නිලූකා ක්‍රිශාන්ති තමන්ට සිදු වූ අසාධාරණයට එරෙහිව නීති ක්‍රියාමාර්ග ඔස්සේ සාධාරණය අත් කරගත් අතර, ඇය

මේ වනවිට තම සැමියා සහ දරුපවුල සමඟ සාර්ථක පවුල් දිවියක් ගත කරමින් සිටී. (මෙම නඩුවේ තීන්දුව පහත සබැඳියාව හරහා ඔබට ලබා ගැත හැක. http://www.right2lifelanka.org/new/what we do/education/land mark cases/niluka krishanthi's case)

05. බදුල්ල හැඬ වූ කන්දකැටියේ සඳුන් මාලිංග ඝාතනය

සඳුන් මාලිංග වයස අවුරුදු 18 ක් පමණ වන බදුල්ල කන්දකැටිය ප්‍රදේශයේ ජීවත් වූ තරුණයෙකි. වර්ෂ 2014 මැයි මස 07 වන දින පස්වරුවේ ඔහු තම මිතුරන් කිහිප දෙනෙකු සමඟ ත්‍රීරෝද රථයක් මිලට ගැනීම සඳහා ත්‍රීරෝද රථයක් පරීක්ෂා කිරීමේ අරමුණෙන් බෝගහපතන ප්‍රදේශයට ගොස් තිබුණි. අදාල ස්ථානයට පිරිස පැමිණ ටික වේලාවක් එම ස්ථානයේ ගතකළේ අදාළ ත්‍රීරෝද රථයේ හිමිකරු එම ත්‍රීරෝද රථය සමඟ පැමිණෙනු ඇතැයි බලාපොරොත්තුවෙනි.

නමුත්, අදාළ ත්‍රී රෝද රථය වෙනුවට පැමිණියේ බදුල්ල පොලිස් ස්ථානයට අනුයුක්තව කටයුතු කරනු ලබන කන්දකැටිය පොලීසියේ නිලධාරීන් පිරිසකි. අදාළ පොලිස් නිලධාරී කණ්ඩායමට සෝමරත්න, අබේරත්න, පද්මකුමාර ගමගේ, රුවන් පුෂ්පකුමාර, විජේරත්න සහ ජයසුන්දර යන නිළධාරීන්ගෙන් සමන්විත විය. සඳුන් මාලිංග ඇතුළු පිරිස අසළට පොලිස් නිළධාරීන් පැමිණි පසු පොලිස් නිළධාරී සෝමරත්න, "උඹලා මොනවද මෙතන කරන්නේ?", යනුවෙන් අසන ලදී. ඊට පිළිතුරු ලෙස සඳුන් මාලිංග කියා සිටියේ, අපි ත්‍රීරෝද රථයක් බැලීමට පැමිණි බවයි, නමුත් එක්වරම මාරාවේශ වූ සෝමරත්න පොලිස් නිළධාරියා, "තොපි නිධන් හාරන්න ආවා නේද?" යැයි පවසමින් පහර දීමට පටන් ගත් අතර, එවිට අනෙක් නිළධාරීන්ද පොලු වලින් පහර දීම ආරම්භ කර තිබේ. පසුව සෝමරත්න විසින් සඳුන් මාලිංග වෙනත් ස්ථානයකට රැගෙන ගොස් නැවතත් පහරදී තිබේ. කෲර ලෙස පහර දීම කළ නිළධාරීන් අනතුරුව සඳුන් මාලිංග ඇතුළු පිරිස පොලිස් ජීප් රථයේ නංවා ගෙන කන්දකැටිය පොලිස් ස්ථානය වෙත රැගෙන යන ලදී.

එදින රාත්‍රිය කන්දකැටිය පොලිසියේ සිරමැදිරියක සඳුන් මාලිංග ඇතුළු පිරිස රඳවා තබා ඇති නමුත්, අත්අඩංගුවට ගත් හේතුව ඔවුන්ට දන්වා නොමැත. ඊට පසු දින එනම්, 2014 මැයි මස 08 වන දින පොලිස් නිළධාරීන් විසින් සඳුන් මාලිංග ඇතුළු පිරිස කන්දකැටිය රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. මෙහිදී සඳුන් මාලිංග පොලීසිය කරන ලද කෲර පහරදීම් නිසා අසාධ්‍ය තත්ත්වයේ පසුවී සිට තිබේ. නමුත් අදාළ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමේදී සෝමරත්න නමැති පොලිස් නිළධාරියාද ඒ අසළ සිටි නිසා පොලීසිය සිදු කළ පහරදීම පිළිබඳව කීමට නොහැකි වී ඇත. වෛද්‍යවරයාත් ඒ පිළිබඳව කිසිදු විමසීමක් හෝ කිසිදු පරීක්ෂාවක් හෝ සිදු නොකර වාර්තාව ලබා දී තිබේ.

අනතුරුව මොවුන් මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පමුණුවා ඇත. එහිදී පොලීසිය විසින් මොවුන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාව වන්නේ සඳුන් මාලිංග ඇතුළු පිරිස අනවසරයෙන් නිධන් හැරීමේ චෝදනාවයි. සඳුන් මාලිංගගේ දෙමාපියන් විසින් නීතිඥවරයෙකු ඉදිරිපත් කර සිටි අතර, එම නීතිඥවරයා පුන පුනා මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ කියා සිටියේ සඳුන් මාලිංගට පොලිසියේදී දරුණු ලෙස වධහිංසා සිදු වී ඇති බවයි. සඳුන් මාලිංග විසින් ද ඒ බව මහේස්ත්‍රාත්වරයාට ප්‍රකාශ කර ඇත. නමුත්, ඒ පිළිබඳව අවධානය යොමු නොකරමින් සඳුන් මාලිංග ඇතුළු පිරිස රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කරන ලදි. බන්ධනාගාරය වෙත ඇතුළත් කළ පසු සඳුන් මාලිංගගේ දෙමාපියන් බන්ධනාගාර නිළධාරීන්ගෙන් ඉල්ලා සිටියේ සඳුන් අසාධ්‍ය තත්ත්වයේ සිටින බැවින් ඔහුව බන්ධනාගාර රෝහල වෙත යොමු කරන ලෙසයි. නමුත් ඊට නිසි

අවධානයක් බන්ධනාගාර නිළධාරීන්ගෙන් නොලැබීම හේතුවෙන් දැඩි අසාධ්‍ය තත්ත්වයේ සිටි සඳුන් මාලිංග තරුණයා බන්ධනාගාරය තුළදීම මෙලොවින් සමු ගත්තේය.

බදුල්ලේ පිහිටි ඌව ශක්ති සංවිධානය හා අනාගතය අපේ අතේ සංවිධානය හරහා මෙම සිද්ධිය රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය වෙත වාර්තා වීමත් සමඟ රයිට් ටු ලයිෆ් ආයතන බදුල්ල කන්දකැටිය ප්‍රදේශය වෙත ගොස් සඳුන් මාලිංග තරුණයාගේ ඥාතීන් හමුවී සියළු කරුණු ගොනු කර ගත් අතර, මෙම සිද්ධියට එරෙහිව හඬ නැගූ බදුල්ල ප්‍රදේශයේ සිවිල් සංවිධාන වල නියෝජනය යටතේ මෙම ක්‍රියාවට එරෙහිව බදුල්ල නගරය තුළ විශාල විරෝධතාවයක් සංවිධානය කරන ලදී. මෙම විරෝධතා ව්‍යාපාරයට හා මෙම සිද්ධිය සම්බන්ධව බදුල්ල තැපැල් කාර්යාලීය ශ්‍රවණාගාරයේ පැවැති මහජන විනිශ්චය සභාව සඳහා ප්‍රදේශයේ දේශපාලනඥයින්, නීතිඥයින්, අනෙකුත් සිවිල් සංවිධාන රාශියක් එක්වීම නිසා ඉන් විශාල බලපෑමක් හා පුළුල් මාධ්‍ය ප්‍රචාරණයක් ලබා දීමට හැකිවිය. ඒ හේතුවෙන් නින්දේ පසුවෙමින් සිට අවදි වූ බදුල්ල පොලිසියත්, නීතිපති දෙපාර්තමේන්තුවත් මීට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කළේය.

ඒ අනුව, සඳුන් මාලිංගගේ දේහය අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය. එහිදී හිසේ පිටුපස තැලුම් තුවාලයක් පැවති බවත්, එමගින් මොළයේ පිටුපස පටක තැලී තිබුන බවත්, මොළය තුළ රුධිර වහනයක් දක්නට තිබූ බවත්, මෙය මාරාන්තික තුවාලයක් බවත්, ඊට අමතරව කොඳු නාරටිය හරහා ආනතියකින් යුක්තව තුවාලයක් පිහිටා තිබූ බවත්, මෙය මොට ආයුධයකින් පහරදීම නිසා හට ගෙන ඇති බවත් අධිකරණ වෛද්‍යවරයාගේ වාර්තාවේ තිබූ කරුණු අතර වඩා වැදගත් කරුණු විය. මහේස්ත්‍රාත් අධිකරණයේ මේ සම්බන්ධයෙන් පැවති මූලික විමර්ශනයේදී මේ කරුණු ඉදිරිපත් කළ නිසා ඉතාමත් කෙටි කාලයක් තුළදී සිද්ධියට අදාළ විත්තිකරුවන්ට එරෙහිව මහාධිකරණයේ අධිචෝදනා ගොනු කිරීමට හැකි විය.

ඒ අනුව, දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තිය යටතේ, නඩු අංක HC 01/2015 යටතේ සිද්ධියට සම්බන්ධ පොලිස් නිළධාරීන් වන සෝමරත්න, අබේරත්න, පද්මකුමාර ගමගේ, රුවන් පුෂ්පකුමාර, විජේරත්න සහ ජයසුන්දර යන අයට විරුද්ධව බදුල්ල මහාධිකරණයේ 2015 ජනවාරි මස අධිචෝදනා ගොනු විය.

මීට අමතරව, රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ නීති ආධාර යටතේ මේ සිද්ධිය සම්බන්ධයෙන් විත්තිකරුවන්ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලද අතර, මේ වනවිට එම නඩුව, නඩු අංක SCFR 157/14 යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

එමෙන්ම, අදාළ සිද්ධියට එරෙහිව 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ විත්තිකරුවන්ට එරෙහිව නඩු පවරන මෙන් නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටීම කිහිප වරක්ම සිදු කළ ද නීතිපතිවරයා ඊට නිසි ක්‍රියාමාර්ග ගනු ලැබුවේ නැත. මේ වෙනුවෙන් අභියාචනාධිකරණය වෙත, නඩු අංක C.A. WRIT 375/15 යටතේ මැන්ඩාමුස් රිට් ආඥාවක් ඉල්ලා පෙත්සමක් ඉදිරිපත් කරමින් රයිට් ටු ලයිෆ් ආයතනයේ මගපෙන්වීම යටතේ වින්දිත පාර්ශවය ඉල්ලා සිටියේ වධහිංසා පනත යටතේ විත්තිකරුවන්ට එරෙහිව නඩු පැවරීමට නීතිපතිවරයාට නියෝග නිකුත් කරන ලෙසයි. නමුත් එහිදී අභියාචනාධිකරණය තම තීරණය දෙමින් ප්‍රකාශ කර සිටියේ විත්තිකරුවන්ට එරෙහිව මේ වනවිටත් නීතිපති විසින් බදුල්ල මහාධිකරණයේ මිනීමැරීමේ වරදට දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ අධිචෝදනා ගොනු කොට විභාග කරමින් පවතින බවත්, එසේම විත්තිකරුවන්ට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ වනවිට විභාග වෙමින් පැවතීමත් යන කරුණු හේතුකොට ගෙන 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ තවදුරටත් ක්‍රියාකිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවයි. ශ්‍රී ලංකාවේ උපරිමාධිකරණය යටතට වැටෙන අභියාචනාධිකරණය දුන් මෙම තීන්දුවත් සමඟ 1994 අංක 22 දරණ වධහිංසා පනත පැනවීමට අදාළ ව්‍යවස්ථාදායකයේ චේතනාව සහ මෙම පනතේ වටිනාකම පිළිබඳව ගැටළුවක් මතුවන බව නිරීක්ෂණය වේ.

නමුත්, අභියාචනාධිකරණයේ එම තීරණයට හිස නැමූ රයිට් ටු ලයිෆ් ආයතනය මහාධිකරණය ඉදිරියේ විභාග වූ මිනීමැරුම් නඩුව කෙරෙහි දැඩි අවධානයකින් පසුවිය. ඒ අනුව, වර්ෂ 2017 ජනවාරි 09 වන දින එම නඩුවට ජයග්‍රාහී තීන්දුවක් ලබා ගැනීමට හැකිවිය. එම තීන්දුව අනුව විත්තිකරුවන් 06 දෙනාටම දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තිය යටතේ මිනීමැරුම නම් වරද සිදු කර ඇති බවට සාධාරණ සැකයෙන් තොරව ඔප්පු වී ඇති බැවින් විත්තිකරුවන් 06 දෙනාම මරණීය දණ්ඩනයට යටත් කළ යුතු බව තීරණය විය. (මෙම නඩුවේ තීන්දුව පහත සබැඳියාව හරහා ඔබට ලබා ගැත හැක. http://www.right2lifelanka.org/new/what we do/education/land mark cases/sandun malinga’s case)




ප්‍රකාශණය

Right to Life Human Rights Centre
මානව හිමිකම් මධ්‍යස්ථානය
மனித உரிமைகள் நடுநிலையம்



**අංක 555, කොළඹ පාර, කටුනායක.**
දුරකථන - 011 7414800, 031 2231969, 031 2221604
ෆැක්ස් - 031 2231969, විද්‍යුත් තැපෑල - right2lifelk@gmail.com
වෙබ් අඩවිය - www.right2lifelanka.org, www.aithiya.com